අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

+9411 27854161
+9411 2784869
moepressroom3@gmail.com

මාධ්‍ය නිවේදනය | ஊடக வெளியீடு | MEDIA RELEASE

MEDIA UNIT

2023-07-19

## අ.පො.ස. (උසස් පෙළ) – 2022(2023) විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීම සහ අ.පො.ස. (උසස් පෙළ) -2023 විභාගය සඳහා අයදුම්පත් කැඳවීම

අ.පො.ස. (උසස් පෙළ) -2023 විභාගය 2023.11.27 දින සිට 2023.12.21 දින දක්වා පැවැත්වීමට මේ වන විට දින නියම කර ඇත.

මෙම විභාගය සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් කැඳවීම 2023.07.07 දින ආරම්භ කළ අතර එම අයදුම්පත් භාර ගැනීම 2023.07.28 දින 23.59 පැයට අවසන් කරනු ලැබේ.

ඒ අනුව ඉහත සඳහන් කාල සීමාව තුළ අයදුම්පත් ඉදිරිපත් කරනු නොලබන, විභාගය සඳහා ප්‍රථම වතාවට පෙනී සිටින කිසිදු අයදුම්කරුවකුහට නැවත අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා සහන කාල සීමාවක් ලබා දීමක් සිදු නොවේ.

කෙසේ වෙතත්, මෙම විභාගය සඳහා දෙවන හෝ තෙවන වර හෝ ඊට පසු වාරයක් සඳහා අයදුම් කරනු වස්, අවසන් වරට (2023.01.23 සිට 2023.02.17 දක්වා) පැවති අ.පො.ස. (උසස් පෙළ) -2022 විභාගයේ ප්‍රතිඵල අපේක්ෂාවෙන් පසුවන අයදුම්කරුවන් සඳහා පමණක් ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසුව අයදුම්පත් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීමට මෙම දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය.

මේ අතර, 2023.02.17 දින අවසන් වූ අ.පො.ස. (උසස් පෙළ) - 2022 විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීම මේ දක්වා ප්‍රමාද වීම සඳහා බලපෑ කරුණු බොහොමයක් මෙම දෙපාර්තමේන්තුවේ පාලනයෙන් පරිබාහිර කරුණු වන අතර එම ගැටළු සඳහා වූ විසඳුම් ක්‍රියාමාර්ගවලදී හැකි සෑම අවස්ථාවකදීම මෙම දෙපාර්තමේන්තුවේ උපරිම දායකත්වය ලබා දී ඇති බව මෙම ක්‍රියාවලිය ආරම්භයේ සිට මේ දක්වා සමීපව නිරීක්ෂණය කළ ඕනෑම අයකුට අවබෝධ වනු ඇත. කෙසේ වෙතත් මේ වන විට මෙම ඇගයීම් ක්‍රියාවලිය එහි අවසන් අදියරට එළඹෙමින් පවතින අතර මෙම විභාගයේ ප්‍රතිඵල 2023 අගෝස්තු මාසයේදී නිකුත් කිරීමට දෙපාර්තමේන්තුවට හැකි වනු ඇත.

තවද අ.පො.ස. (උසස් පෙළ) විභාගයක් සංවිධානය කර පැවැත්වීම සඳහා අවශ්‍ය වන අවම කාල සීමාව සැළකිල්ලට ගෙන 2023 අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා අයදුම්පත් කැඳවීම 2023.07.07 දින ආරම්භ කරන ලද අතර රට තුළ පැවති විවිධ අර්බුදකාරී වාතාවරණයන් හමුවේ වුවද මෙම දෙපාර්තමේන්තුව විසින් නියමිත කාල සීමාවන් තුළදී මෙම තීරණයන්ට නොඑළඹුනි නම් 2023 අ.පො.ස. (උසස් පෙළ) විභාගය පැවැත්වීම 2024 වසරේ මාර්තු මාසයෙන් ඔබ්බට ප්‍රමාද විය හැකිව තිබූ බවද සඳහන් කරමි.

එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

මාධ්‍ය ඒකකය